# අපේ දැක්ම

සියලුම ශ්‍රී ලාංකිකයන් වෙත වාසනාව ගෙන එන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙසින් සැමදා කටයුතු කිරීම.

# අපේ මෙහෙවර

නවීන තාක්ෂණය භාවිතා කරමින් නිර්මාණාත්මක හා ආකර්ශනීය ලොතරැයි ඉදිරිපත් කිරීම, විශ්වාසය තහවුරු කිරීම හා හවුල්කරුවන්ගේ ප්‍රාර්ථනා සඵල කිරීමෙහිදී හැම කල්හිම අති විශිෂ්ට වීම.

# අපේ අරමුණු

වෙළඳපොළ කොටස වැඩි කිරීම.

ජනාධිපති අරමුදලට සපයන දායකත්වය උපරිම කිරීම.

නවීන තාක්ෂණය ඵලදායී ලෙස ග්‍රහණය කර ගැනීම.

කොටස්කරුවන්ගේ අපේක්ෂා සඵල කිරීම.

# අපගේ මූලික වටිනාකම්

**අවංකභාවය**

අපගේ ලොතරැයි ඉදිරිපත් කිරීම හා ගනුදෙනු සිදු කරන ආකාරය සාධාරණ, අවංක හා විශ්වසනීය වේ.

**ධනාත්මක ආකල්පය**

ලොතරැයි ව්‍යාපාරය කරගෙන යද්දී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයෝ තමන් මුහුණ දෙන සෑම අභියෝගයක් ම සුබවාදී ලෙස ග්‍රහණය කර ගනිති.

**ප්‍රතිඵල වෙත නම්‍යීකරණය**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයෝ තම භූමිකා තුළ විශ්වසනීය වෙති. දෙන ලද ඉලක්ක ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරති.

**නිර්මාණශීලිත්වය**

ව්‍යාපාරය දියුණු කිරීම සඳහා අදහස් ඉදිරිපත් කිරීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයන් දිරි ගන්වනු ලැබේ. එසේම වෙළඳපොළෙහි මූලෝපායිකව හා තරගකාරී ලෙස සිදු වන වෙනස්කම් හා අදාලව ඔවුහු ක්ෂණිකව ක්‍රියාත්මක වෙති.

**සාමූහිකත්වය**

ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයෝ එක්ව වැඩ කරති. ඒ අතර ම විවෘතභාවය, අන්‍යෝන්‍ය ගරුත්වය හා පෞද්ගලික සංවර්ධනය ද පවත්වා ගනිති.

**විශිෂ්ටත්වය වෙත නැඹුරුව**

අඛන්ඩව ම සේවා තත්වය වැඩි කර ගැනීම වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයෝ වෙහෙසෙති.

# සමාගම

**මණ්ඩලයේ නම**
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**නීතිමය ස්වරූපය**
1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාපිත කරන ලද මණ්ඩලයකි.

**සමාරම්භය**
1983 ජනවාරි 19දා

**ලියාපදිංචි**
නො. 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත,
යුනියන් පෙදෙස, කොළඹ 02.

**දුරකථන අංක**
011 2 333 456-8, 011 4 824 824

**ෆැක්ස්**
011 2 333 545

**ඊමේල්**
devlottr@slt.lk

**වෙබ්**
www.dlb.lk

**TIN**
409089844

**අධ්‍යක්ෂ මණ්ඩලය (2013)**
1. වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ මහතා - සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
2. නීතිඥ ගාමිණී ඒකනායක මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. ඩී.එන්. නානායක්කාර මහතා - අධ්‍යක්ෂ
4. රංජිත් තේනුවර මහතා - අධ්‍යක්ෂ
5. ආර්. කේ. ජයලත් මහතා - අධ්‍යක්ෂ

**විගණක**
විගණකාධිපති

**අභ්‍යන්තර විගණන**
සුදර්ශන පුෂ්පකුමාර සහ සමාගම, වරලත් ගණකාධිකාරිවරු

**බැංකුකරුවෝ**
මහජන බැංකුව, ලංකා බැංකුව, සම්පත් බැංකුව

**ශාඛා කාර්යාල**

**කුරුණෑගල**
අංක 121, නුවර පාර, කුරුණෑගල
දුරකථනය / ෆැක්ස් 037 2233560, 037 4641002

**මාතර**
අංක 42/1, ධර්මපාල මාවත, මාතර
දුරකථනය / ෆැක්ස් 041 2234664

**මොණරාගල**
නව බස්නැවතුම්පොළ, මොණරාගල
දුරකථනය / ෆැක්ස් 055 4498028

# සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය

මුලදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ලෙස හැඳින්වුණු සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවනු ලැබුවේ 1983 ජනවාරි 19දා ය. මධ්‍යස්ථානයේ මූලික අභිමතාර්ථය වූයේ රජයට මුදල් රැස් කිරීම පිණිස උපකාර කිරීමයි.

අනතුරුව 1993 දී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය 'සංවර්ධන ලොතරැයි භාරය' නම් භාරකාර මණ්ඩලයක් බවට පත් කරන ලදී. 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ 1997 අගෝස්තු 12දා එම භාරය සංවර්ධන ලොතරැයි මණ්ඩලය බවට පත් කරන ලදී.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1983දී ලොතරැයි වෙළඳපොළට පිවිසුනේ ක්ෂණික ලොතරැයි හඳුන්වා දෙමිනි. 1987 දී ශනිදා වාසනාව හඳුන්වා දෙමින් ලංකා ඉතිහාසයේ පළමු වතාවට රූපවාහිනියෙන් ලොතරැයි දිනුම් ඇදීම හඳුන්වා දෙන ලදී. මුලදී සෙනසුරාදා පමණක් දිනුම් අදින ලද ශනිදා වාසනාව පසුව බදාදාට ද හඳුන්වා දෙන ලදී.

වාසනා චක්‍රය රූපවාහිනී දිනුම් ඇදීමේ දෙවන පියවර 1998 ජනවාරි 25දා, ඉරිදා, ආරම්භ විය. එය දිනුම් නො ලද සූරන ලොතරැයි වෙනුවෙන් හඳුන්වා දෙන ලද්දකි. මෙම වැඩසටහනට ජනතාවගෙන් ලැබුණු ප්‍රතිචාරය ඉතා සාධනීය විය. දෙවන රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම වන සංවර්ධන වාසනාව 1998 ඔක්තෝබර් 9දා ආරම්භ කරන ලදී. එය අඟහරුවාදා හා සිකුරාදා දිනුම් අදින ලදී. මෙම ටිකට් පතෙහි විශේෂ ලක්ෂණය වූයේ එහි රාශි චක්‍රයේ සංකේත හා දිනුම් අංක ඇතුළත් වීමයි.

2004 ජනවාරි 26දා සිට සඳුදා හා බ්‍රහස්පතින්දා දිනුම් අදින ජයෝදා ලොතරැයිය ආරම්භ කරන ලදී. සාමාන්‍ය සුපිරි ජයමල්ල තෑගි මුදලට අමතරව සුපිරි ජයමල්ල තෑගි මුදලක් ද මෙමගින් හඳුන්වා දෙන ලදී. එය රුපියල් කෝටියකින් ඇරඹිණි. ලොතරැයි ඉතිහාසයේ පළමු වතාවට සාමාන්‍ය සුපිරි ජයමල්ල ජයග්‍රාහකයන්ට රුපියල් මිලියනයක් හෝ එම වටිනාකමට නිවසක් හෝ පිරිනැමිණි.

2009 අප්‍රේල් 10දා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනජය ලොතරැයිය දියත් කළේ ය. එය දිනුම් අදිනු ලබන්නේ බ්‍රහස්පතින්දා හා ඉරිදා ය. සුපිරි ත්‍යාගය දිනා ගැනීම සඳහා අංක 64ක් අතරින් අංක හතරක් ගැලපිය යුතු විය. තවත් යන්ත්‍රයක් මගින් අංක 12ක් අතරින් සුපිරි අංකය දිනුම් අදිනු ලැබේ. සුපිරි ජයමල්ල ත්‍යාගය ආරම්භ වුණේ රුපියල් ලක්ෂ 25 කිනි.

2012 ජූලි 11දා සුපර් බෝල් ලොතරැයිය හඳුන්වා දීම ලොතරැයි ඉතිහාසයේ හැරවුම් ලක්ෂයක් විය. මෙම සුවිශේෂ ලොතරැයිය රුපියල් කෝටි තුනක් වන ඉතිහාසයේ වැඩිම තෑගි මුදලින් ආරම්භ විය. එය අති සාර්ථක ලෙස පොදු ජනතාව ආකර්ශනය කර ගත්තේ ය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ජනනය කරනු ලබන ආදායම සමස්ත ජාතියේ ම සමෘද්ධිය වෙනුවෙන් ජනාධිපති අරමුදලට බැර කරනු ලැබේ. එයින් 50%ක් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදලට බැර වේ. ඉතිරි මුදලින් සමස්ත ජනතාවගේ ම අනාගතය යහපත් කිරීම පිණිස දිළිඳු ජනයාගේ ජීවන තත්වය නගාසිටුවීම, සෞඛ්‍ය අවශ්‍යතා සපිරීම, ආගමික ස්ථාන නඩත්තු කිරීම, සුබසාධක සංගම්වලට උපකාර කිරීම, ක්‍රීඩාව හා කලාව දියුණු කිරීම ආදී කටයුතු සඳහා යෙදවීමට පියවර ගනිමින් තිබේ.

# මංසලකුණු

## සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සංවර්ධන ගමනේ මංසලකුණු

**1983**

ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමු ක්ෂණික ලොතරැයි ටිකට් පත හඳුන්වා දෙමින් ක්ෂණික ලොතරැයි වෙළඳපොළේ පුරෝගාමියා වීම

**1987**

පළමු රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම ශනිදා වාසනාව හඳුන්වා දීම

**1993**

සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය සංවර්ධන ලොතරැයි භාරය බවට පත් කරන ලදී.

**1997**

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව සංවර්ධන ලොතරැයි භාරය සංවර්ධන ලොතරැයි මණ්ඩලය බවට පත් කරන ලදී.

- රු. බිලියන දෙකක ආදායම් මට්ටමට ළඟා විය.

**1998**

- ජයග්‍රහණය නො කළ සූරන ලොතරැයි වෙනුවෙන් වාසනා චක්‍රය රූපවාහිනී දිනුම් ඇදීම හඳුන්වා දීම. සංවර්ධන වාසනාව ලොතරැයිය දියත් කරන ලදී. ඒ සමගම වින්ඩෝස් ක්ෂණික ලොතරැයිය හා සුපිරි සුඛෝපභෝගී මෝටර් රථයක් තෑගි දෙන රුපියල් සීයේ යුරේකා ක්ෂණික ලොතරැයිය හඳුන්වා දීම.

**1999**

ලෝක බැංකුවේ ආධාර ඇතිව Y2K ප්‍රශ්නයට මුහුණ දිය හැකි පරිදි පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීම.




**2004**

මුදල් ත්‍යාගයක් හෝ නිවසක් හෝ තෑගි ලෙස පිරිනමන ජයෝදා නිකුත් කරන ලදී.

- රු. බිලියන පහක ආදායම් මට්ටමට ළඟා විය.

**2008**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ම හිමි අංක 356,ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, කොළඹ 02 ලිපිනයේ නව ගොඩනැගිල්ලට පිවිසෙන ලදී.

- රු. බිලියන පහක ආදායම් මට්ටමට ළඟා විය.

**2010**

සුපිරි ජයමල්ල ත්‍යාගයක් සමග ජන ජය ලොතරැයිය නිකුත් කරන ලදී.

**2011**

නියත ජය ලොතරැයිය දියත් කරන ලදී.

**2012**

රු. කෝටි තුනක් වන ඉතිහාසයේ සුවිසල් ම සුපිරි ජයමල්ල ත්‍යාගය සමග සුපර් බෝල් ලොතරැයිය නිකුත් කරන ලදී.



# සභාපතිගේ විවරණය

“1983 වසරේ ආරම්භයේ සිට සංවර්ධන ලොතරැයි මණ්ඩලය මේ වන විට වසර තිහක් සපුරා තිබේ. එහි සංස්ථාපිත අරමුණ වන්නේ ජනාධිපති අරමුදල වෙනුවෙන් මුදල් සම්පාදනයයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහපොළ භාරකාර අරමුදල හරහා සරසවි සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනමයි. එසේම, එහි අරමුදල්වලින් මූල්‍ය දුෂ්කරතා තිබෙන රෝගීන්ට ආධාර කිරීම ඔස්සේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට ද සහන පිරිනැමේ.”

“……….. මෙම මූල්‍ය වර්ෂය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදලට රු. බිලියන දෙකකින් දායක වී තිබේ. එය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය තුළ කරන ලද ලොකුම දායකත්වයයි.”

2013 වසර වෙනුවෙන් වන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය සහිත වාර්ෂික වාර්තාව ඔබ හමුවේ තැබීම සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති ලෙස මගේ වැදගත් ම කාර්යයකි.

1983 වසරේ ආරම්භයේ සිට සංවර්ධන ලොතරැයි මණ්ඩලය මේ වන විට වසර තිහක් සපුරා තිබේ. එහි සංස්ථාපිත අරමුණ වන්නේ ජනාධිපති අරමුදල වෙනුවෙන් මුදල් සම්පාදනයයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහපොළ භාරකාර අරමුදල හරහා සරසවි සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනමයි. එසේම, එහි අරමුදල්වලින් මූල්‍ය දුෂ්කරතා තිබෙන රෝගීන්ට ආධාර කිරීම ඔස්සේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට ද සහන පිරිනැමේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහින්ද චින්තනයේ වටිනාකම් මත පදනම්ව ජාතියේ ජනතාවට විෂමතාවලින් තොරව සමාන ලෙස සැලකීම ගොඩනගාගෙන ඇත. එසේ කරනුයේ අපගේ කොටස්කරුවන්ගේ අභිලාෂයන් ආරක්ෂා කරමින් හා ඔවුන්ට සෑම කල්හි ම මූල්‍ය ප්‍රතිලාභ ලබා දෙමිනි.

2013 මූල්‍ය වර්ෂය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉහළම ආදායම් වාර්තා තබා ඇති බව අප නිවේදනය කරන්නේ ආඩම්බරයෙනි. මෙම වසර තුළදී අපගේ කොටස්කරුවන් වෙනුවෙන් රු. බිලියන 2.1ක ලාභයක් ලබන්නට අපට හැකි විය. මෙය පසුගිය වසරේ කොටස්කරුවන් වෙනුවෙන් ලද ලාභයට සාපේක්ෂව 10%ක වර්ධනයකි. මෙම කාල වකවානුව තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මුළු ආදායම රු. බිලියන 8.6 සිට රු. බිලියන 10.6 දක්වා වර්ධනය විය. එය 23%ක වර්ධනයකි. මෙම මූල්‍ය වර්ෂය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ජනාධිපති අරමුදලට රු. බිලියන 2ක දායකත්වයක් සපයා ඇති බව ද වැඩිදුරටත් පැවසිය යුතු ය. එය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසයේ ඉහළ ම දායකත්වයයි.

අපගේ වටිනා පාරිභෝගිකයන්ට ලබා දුන් තෑගි මුදල් ද වැඩි කරන ලදී. ඒ වෙනුවෙන් 2013 වසරේදී රු. බිලියන 6.4ක් වැය කරන ලද අතර පසුගිය වසරේදී වැය කරනු ලැබුවේ රු. බිලියන 5.1ක් පමණි. එම වර්ධනය ද විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය හුදෙක් ම ලාභය වෙනුවෙන් පමණක් පවත්වාගෙන යන ආයතනයක් නො වේ. එය සමායතන සාමූහික වගකීම ගැන ද අවධානය යොමු කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලය දියත් කර තිබෙන ව්‍යාපෘති තුළ ලාභ ලැබීම හා සමාජ වගකීම අතර තුලනය අවධාරණය කර තිබේ. එවැනි ව්‍යාපෘති බොහොමයක් ප්‍රජා සම්බන්ධතා ගොඩනැගීම ඉලක්ක කළ මානුෂීය සේවාවන් ය. එසේම අපගේ සංස්කෘතික උරුමය නිරූපණය කරන ව්‍යාපෘති ද අප විසින් දියත් කර තිබේ. විවිධාංගීකරණය කරන ලද මෙම ව්‍යාපෘති ඔස්සේ සෘජු හා වක්‍ර රැකියා 20,000ක් සපයා ඇති බව පවසන්නේ ආඩම්බරයෙනි. අනාගතයේදී තවත් යෝග්‍ය ක්ෂේත්‍ර වෙත අපගේ සමායතන සමාජ වගකීම් ව්‍යාපෘති විහිදුවන්නට සැලසුම් කර තිබේ.

අවසාන වශයෙන්, පසුගිය කාලය තුළ කළමනාකරණ මණ්ඩලයට ලබා දුන් සහයෝගය වෙනුවෙන් මම අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සියලු කොටස්කරුවන්ට ස්තුති කරමි.

අපගේ බෙදාහරින්නන්, අලෙවිකරුවන්, ඔවුන්ගේ සහායකයන් හා කාර්ය මණ්ඩලය විසින් අපගේත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේත් ඉලක්ක සාධනය සඳහා කර තිබෙන කැප කිරීම් හා ප්‍රයත්නයන් සඳහා හිමි විය යුතු ඇගයීම ද මෙහි වාර්තා කළ යුතු ය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුළ අපගේ පැවැත්ම අරුත්බර වුණේ ඔවුන්ගේ දායකත්වයෙනි.

අප විසින් ඉදිරිපත් කරන ලද නිෂ්පාදන කෙරෙහි විශ්වාසී හා පක්ෂපාතී වූ අපගේ සම්භාවනීය පාරිභෝගිකයන් හා හවුල්කරුවන් වෙත ද මගේ අවංක ඇගයීම හිමි විය යුතු ය. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දැක්ම යථාවත් කරමින් ශක්තියෙන් හා ලැදිකමකින් යුතුව මීළඟ වසරට පා තබන්නට අපට හැකියාව ලැබී තිබෙන්නේ ඔවුන් නිසා ය.



**වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# අධ්‍යක්ෂ මණ්ඩලය (2013)



**වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ මහතා -**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී



**නීතිඥ ගාමිණී ඒකනායක මහතා -**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ



**රංජිත් තේනුවර මහතා -** අධ්‍යක්ෂ
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
අධ්‍යක්ෂ - මහපොළ උසස් අධ්‍යාපන
ශිෂ්‍යත්ව භාරකාර අරමුදල



**ඩී.එන්. නානායක්කාර මහතා** - අධ්‍යක්ෂ
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
ජනාධිපතිවරයාගේ ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්



**ආර්. කේ. ජයලත් මහතා -** අධ්‍යක්ෂ
සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
සහකාර අධ්‍යක්ෂ - මුදල් හා සැලසුම්
අමාත්‍යාංශය

# අධ්‍යක්ෂ මණ්ඩල විවරණය

ගෙවී ගිය 2013 වසර වෙනුවෙන් වූ වාර්ෂික වාර්තාව හා මූල්‍ය විවරණය ඔබ හමුවේ තබන්නේ මහත් සතුටිනි.

1983 සිදු වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමාරම්භයේ සිට අපගේ අවසන් අරමුණ වූයේ අප විසින් ජනනය කරනු ලබන ආදායම් ජනාධිපති අරමුදලට හා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදලට බැර කිරීමයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉතිහාසයේ වැඩි ම ආදායම ඉපැයූ බව නිවේදනය කරන මෙම මොහොත ඇත්තෙන් ම සාඩම්බර අවස්ථාවකි. එසේම, ජයග්‍රාහයකයන්ට මෙතෙක් ඉතිහාසයේ වැඩි ම මුදල් ප්‍රමාණය ලබා දෙන්නට ද අපි සමත් වුණෙමු. ජනාධිපති අරමුදලට බැර කරන ලද මුදල් ප්‍රමාණය රු. මිලියන 2026කි. මේ ප්‍රතිඵල අපගේ ක්‍රියාකාරීත්වයේ සාර්ථකත්වයට සාක්ෂි සපයයි.

විවරණයට බඳුන් වන 2013 මූල්‍ය වසරේදී අපි ලොතරැයි දිනීමේ අලුත් විකල්ප හා අවස්ථා පාරිභෝගිකයන්ට ලබා දෙන නිර්මාණාත්මක අලුත් ලොතරැයි කීපයක් හඳුන්වා දුන්නෙමු.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය රටේ ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායක් ලෙස සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 20,000ක් විවෘත කරමින් ශ්‍රී ලංකා ආර්ථිකයට විවිධ මූල්‍ය මාර්ග ඔස්සේ දායක වී තිබේ. ඒ අතර සෞඛ්‍ය ක්ෂේත්‍රයට දක්වන ලද දායකත්වය, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අරමුදල් සැපයීම, ආගමික ආයතන නඩත්තු කිරීම, සුබසාධන සමාජ වලට උපකාර කිරීම, ක්‍රීඩා හා කලා ක්ෂේත්‍රයට අත දීම ආදිය තිබේ.

අපේ සමාරම්භයේදී අපි මුලින් ම ක්ෂණික ලොතරැයි හඳුන්වා දුන්නෙමු. දැන් අපට ශනිදා වාසනාව, සංවර්ධන වාසනාව, ජයෝදා, ජන ජය, නියත ජය හා සුපර් බෝල් ඇතුළු ලොතරැයි පෙළක් ම තිබේ. අපගේ තිස්වන සංවත්සරය සැමරූ 2013 වසර අපට සුවිශේෂ වැදගත්කමක් තිබුණු වසරක් විය.

රාජ්‍ය ව්‍යවසායක් ලෙස රජය වෙනුවෙන් අප විසින් අනිවාර්යයෙන් ම කළ යුතුව තිබෙන මූල්‍ය දායකත්වයන් සැපයීම කලට වේලාවට කරන ගමන් ම සංවිධානයේ සම්පත් ආරක්ෂා කර ගනිමින්, මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය හා කාර්යක්ෂමතාව විවරණය කිරීම සාර්ථකව කරගෙන යාමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය සමත් වීම සතුටට කරුණකි.

දැවැන්ත අභියෝග මධ්‍යයේ අපි ඵලදායිතාව, ඉහළම ප්‍රතිඵල හා හොඳම ක්‍රියාකාරීත්වය සාක්ෂාත් කර ගත්තේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද කළමනාකරණ ප්‍රතිපත්ති හා ගනු ලැබූ නිවැරදි තීරණවලටත්, අපගේ සේවකයන්ගේ, නියෝජිතයන්ගේ, අලෙවිකරුවන්ගේ හා සියලු හවුල්කරුවන්ගේ කැපකිරීම්වලටත්, විගණනවරුන්ගේ මග පෙන්වීමටත් ස්තූති වන්නට ය.

**ඩී. එන්. නානායක්කාර මහතා**
අධ්‍යක්ෂ
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# කළමනාකරණ කණ්ඩායම



**මාධව දේවසුරේන්ද්‍ර මහතා -**
සාමාන්‍යාධිකාරී



**අනුර ජයරත්න මහතා -**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)



**විජිතා සෝමරත්න මෙනෙවිය -**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)



**ඩී.ඩී.සී. දම්මින්ද මහතා -**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)



**කපිල බුලත්සිංහල මහතා -**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)



**රිෂිනි රූපසිංහ මෙනෙවිය -**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)



**සුනිල් ජයරත්න මහතා -** සහකාර
සාමාන්‍යාධිකාරී (මූල්‍ය)



**කසුන් ජයසුන්දර මහතා -**
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)



**මේජර් ජේ.එම්.ඩී.ඒ. ප්‍රසන්න -**
ප්‍රධාන ආරක්ෂක නිලධාරී



**නිශාන් පෙරේරා මහතා -**
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)



**චමින්ද පරනමාන -**
පරිපාලන නිලධාරී



**ඩී. විනීත රුබේරු මහතා -**
තොරතුරු තාක්ෂණ උපදේශක



**කපිල මුනසිංහ මහතා -**
අලෙවි උපදේශක

# මෙහෙයුම්

**කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය**

1983 ජනවාරි 19දා අපගේ සමාරම්භයේ සිට ලොතරැයි මණ්ඩලය රටේ ලොතරැයි සමාගම් දෙකෙන් එකක් ලෙස ද, රාජයට අයත් ව්‍යවසායක් ලෙස ද පැවතිණි. එබැවින් අප සංවිධානයේ ව්‍යාපාර කටයුතු පවතින සමාජ ආර්ථික පරිසරය හා කලින් කලට රජය විසින් ජන ජීවිත හා සමාජ ආර්ථික පරිසරය නගා සිටුවීම පිණිස ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති හා මුලපිරුම් මත රඳා පවතී.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ජනනය කරන ලද අදායම ජනාධිපති අරමුදලට බැර කරන ලදී. එයින් 50%ක් භාවිතා කරනු ලබන්නේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල වෙනුවෙනි. ඉතිරියෙන් දුප්පතුන්ගේ ජීවිත නගා සිටුවීම සඳහා වන විවිධ මූල්‍ය ව්‍යෘති ක්‍රියාත්මක කරනු ලැබේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයට, ආගමික ස්ථාන නඩත්තුවට, සුබසාධන සංගම්වලට, ක්‍රීඩා හා කලා කටයුතුවලට ද අරමුදල් වැය කෙරේ.

**2013 ශ්‍රී ලංකා ආර්ථිකය**

මුදල් හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ආර්ථික දත්ත අනුව 2013දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 7.3%කින් වර්ධනය විය. ඒ වනාහි 2012 වසරේ මුහුණ දුන් දේශීය හා විදේශීය අභියෝග හමුවේ ආර්ථික වර්ධන වේගය පැවති 6.3%ක මට්ටමෙන් ඉදිරියට එමිනි. 2009 සිට පසුගිය වසර නවය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය 6.7%ක සාමාන්‍ය තත්වයක පැවති අතර ඊට පෙර ආර්ථික වර්ධන වේගය සාමාන්‍යයෙන් 4.5%ක් විය.

එහෙත්, අයහපත් කාලගුණික තත්වයන්, තෙල් මිළ ඉහළ යාම නිසා මතු වූ තත්වයන් හා යුරෝපයේ සහ එක්සත් ජනපදයේ මූල්‍ය අර්බුදය හේතුවෙන් ආර්ථික වර්ධනය අඩාල විය. පසුගිය වසර හතරක කාලය තුළ ආර්ථික වර්ධන වේගය 7.5%ක මට්ටමේ පැවති අතර එයට හේතුව වූයේ සාමය හා ආර්ථිකය ඉහළ වර්ධන මාර්ගයකට පිවිස තිබීමයි. යුද ගැටුම්වලින් පසු ඇති වූ සාමය හා සංහිඳියාව වර්ධනයට ඉවහල් වූ අතර අලුත් ධාරිතාවන් ගොඩනැගිණි. ආර්ථිකයේ රජයේ ආයෝජන වැඩි වීම, සම්ප්‍රදායික හා නැගී එන ක්ෂේත්‍රවල පෞද්ගලික ආයෝජන වර්ධනය වීම හා ස්ථාවර මහේක්ෂ ආර්ථික තත්වයන් එයට හේතු විය.

2013දී ආර්ථික වර්ධනය උද්ධමනයට වඩා වැඩි වූ අතර උද්ධමනය පස්වෙනි වසරටත් නො කඩවා තනි ඉලක්කමේ අගයක පැවතිණි. මෙම වර්ධනයත් සමග ශ්‍රී ලංකාව බොහෝ අංශවලින් කැපී පෙනෙන සංවර්ධනයක් අත් කර ගත්තේ ය. දරිද්‍රතාව 6.7%ක් දක්වා අඩු විය. විරැකියා අනුපාතිකය 4.4%ක මට්ටමේ පැවතිණි. ඒක පුද්ගල ආදායම එක්සත් ජනපද ඩොලර් 3280 දක්වා වර්ධනය විය. මෙම සංදර්භය තුළ 2016 වන විට ඒක පුද්ගල ආදායම ඩොලර් 4000 දක්වා වැඩි කර ගන්නට හැකි වන අතර මධ්‍යම මට්ටමේ ආර්ථිකයක් ඇති රටක් ලෙස ස්ථාවරය තහවුරු කර ගන්නට ශ්‍රී ලංකාවට හැකි වනු ඇත.

2013 වසරේ ආර්ථික වර්ධනයට ක්ෂේත්‍ර තුනේ ම වර්ධනය ඉවහල් විය. දෙවන කාර්තුව වන විට කර්මාන්ත හා සේවා අංශ යථා තත්වයට පත් වීම හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රබල දායකත්වය මෙයට බලපෑවේ ය. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමකයට සාපේක්ෂව 2013 උද්ධමන අනුපාතිකය 6.7% ක මට්ටමේ තිබිණි. 2008 වසරේ පැවති 16.3% මට්ටමට සාපේක්ෂව සැලකූ කල උද්ධමනය පසුගිය පස් වසර තුළ තනි ඉලක්කම් මට්ටමේ තිබීම සැලකිය යුතු ජයග්‍රහණයකි. විරැකියා අනුපාතිකය 4.4%ක මට්ටමේ තිබිණි. එමගින් නිරූපණය වූයේ අලුතෙන් රැකියා සොයා එන්නන් ශ්‍රම බලකායට එක් වීමයි. මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ පොළී අනුපාතික වේගයෙන් පහත වැටිණි. රජයේ සුරැකුම්පත්වල සඵල පොළී අනුපාතික ද 2013දී 8%ක මට්ටමට පහත වැටිණි. මූල්‍ය ක්ෂේත්‍රය දිගට ම ස්ථාවරව පැවති අතර අභියෝගාත්මක ජාත්‍යන්තර මූල්‍ය වාතාවරණය මැද මූල්‍ය පද්ධතිවල ස්ථාවරත්වය තහවුරු කරන ලදී. මහ බැංකුව හා රජය විසින් ඒ වෙනුවෙන් අනුගමනය කරන ලද පියවර ඵලදායී විය.

අයවැය පරතරය පිට පිට සිව්වන වසරටත් පහත වැටිණි. එය 2013දී ඉලක්ක කරන ලද 5.8% මට්ටමට සාපේක්ෂව 5.9% මට්ටමේ පැවතිණි. රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රය ස්ථාවර කිරීමට ගන්නා ලද ප්‍රයත්නයන් එයින් පරාවර්තනය විය. රාජ්‍ය ආයෝජන මට්ටම මධ්‍යස්ථ 5.5%ක මට්ටමේ පැවතිණි.

අදාළ වසර තුළ ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන්ගේ මූල්‍ය තත්වයේ ද වර්ධනයක් දක්නට ලැබිණි. එහෙත් දේශීය මිළ ගැලපුම් ජාත්‍යන්තර මිළ හා සාපේක්ෂව තිබුණේ පසුපසිනි. 2013දී ද ආනයන පහත වැටෙමින් පැවති අතර සමස්තයක් ලෙස අපනයන ශක්තිමත් විය. එය වෙළඳ ශේෂයේ පහත වැටීමට දායක විය.

විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය වර්ධනය වෙමින් තිබුණු අතර 2012 වසරේ මුලදී හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති එයට හේතු විය. එම ප්‍රතිපත්ති මගින් මහේක්ෂ ආර්ථික ස්ථාවරත්වය තහවුරු වූ අතර එයින් විදේශ ඉල්ලුම ඉහළ ගියේ ය. බොහෝ උසස් හා ඉදිරියට එමින් ඇති වෙළඳපොළ ආර්ථිකයන්ගේ යථා තත්වයට පත් වීම සෙමින් සිදු වීම, මැද පෙරදිග කලාපයේ භූ දේශපාලනික ආතතිය, යුරෝ කලාපයේ මූල්‍ය අර්බුදය හා ප්‍රධාන මහ බැංකු විසින් දිගු කාලීන වත්කම් මිළ දී ගැනීම අඩු වන්නට හේතු වේ යයි අපේක්ෂිත ජාත්‍යන්තර ප්‍රාග්ධන ගලනයේ වෙනස්කම් බාහිර වෙළඳාමේදී හා මූල්‍ය ගනුදෙනුවලදී මුහුණ දෙන ලද ප්‍රධාන අභියෝග වේ.

# මෙහෙයුම්

විදේශ රැකියාවලින්, සංචාරක ව්‍යාපාරයෙන් හා සේවා අපනයනයෙන් ද, එසේම ප්‍රාග්ධනය රට තුළට ගලා ඒමෙන් ද ඇති වූ අතිරික්තය රටේ ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කිරීමට ඉවහල් විය. එහි ප්‍රතිඵලයක් ලෙස නිල සංචිත ප්‍රමාණය 2013 වසර අවසානය වන විට දළ වශයෙන් එක්සත් ජනපද ඩොලර් බිලියන 7.5 මට්ටමට වර්ධනය විය. කෙටි කාලීන ප්‍රාග්ධන අවශ්‍යතා කළමනාකරණය කර ගනිමින් බාහිර ස්ථාවරත්වය පවත්වාගෙන යාමට එය ප්‍රමාණවත් ආරක්ෂාවක් විය.

ආර්ථික හා සමාජ සංවර්ධනය අත්පත් කර ගැනීමේදී මැද මට්ටමේ ආර්ථිකයක් ලෙස ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු වන අභියෝග රැසක් තිබේ. රජයේ අයවැය පියවීම සඳහා ණය මත රඳා පැවතීම අවම කිරීම, ආනයන ආදේශන, බලශක්ති සංරක්ෂණය හා පුනර්ජනනීය බලශක්ති ජනනය ශක්තිමත් කිරීම, ජාත්‍යන්තර වෙළඳපොළේ  ඉහළ තෙල් මිළට හැඩගැසීම, පාරිභෝජන රටා වෙනස් කිරීම, නව යටිතල පහසුකම් ධාරිතාවන් ඵලදායී ලෙස භාවිතා කිරීම, සංචාරක ව්‍යාපාරය දිරි ගැන්වීමට පියවර ගැනීම, තරුණ විරැකියා මට්ටම අවම කිරීම, ඵලදායිතාව නැංවීම වියපත් වන ජනගහණය හා සම්බන්ධ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම අවධානය යොමු විය යුතුව තිබෙන ප්‍රධාන අභියෝගයි.

### 2014 වසරේ ආර්ථික තත්වය

මහේක්ෂ ආර්ථික ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කිරීමේ වැදගත්කම හා අභ්‍යන්තර, බාහිර කම්පනයන් හමුවේ ආර්ථිකයේ දරා ගැනීමේ ශක්තිය වැඩිදියුණු කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ වැදගත්කම රජය විසින් පැහැදිලිව හඳුනාගෙන තිබේ.

2014 වසරේදී ද ආර්ථිකය 7.5%කට වැඩි වර්ධන වේගයකින් සංවර්ධනය වනු ඇත. සාමකාමී වාතාවරණය, යටිතල පහසුකම් සංවර්ධනය තුළින් නිර්මානය වූ අමතර ධාරිතාව හා අපනයනයන්ගේ වර්ධනය, ආනයන ආදේශනය, ස්ථාවර මහේක්ෂ ආර්ථික තත්වයන්, දේශපාලන ස්ථාවරත්වය හා ගෝලීය ආර්ථිකයේ සුබවාදී තත්වය හේතුවෙන් එය මධ්‍ය කාලීනව 8%ක වේගවත් ආර්ථික වර්ධන අනුපාතයක් බවට පත් වනු ඇත. පසුගිය පස් වසර තුළ උද්ධමනය කළමනාකරණය කර ගැනීමේ සාර්ථකත්වය හා අයවැය පරතරය අවම කර ගැනීම හේතුවෙන් උද්ධමනය 2014දී ද දිගට ම තනි ඉලක්කමේ අගයකින් පවත්වා ගැනීමට හැකි වනු ඇත.

### රජයේ හා රජයට අයත් ව්‍යවසායන්ගේ ආදායම

විවරණයට බඳුන් වන 2013 වසර තුළ රජයේ සමස්ත ආදායම 8.1%කින් වර්ධනය විය. ඒ වනාහි 2012දී වාර්තා වූ රුපියල් බිලියන 1052ට සාපේක්ෂව ගත් කල 2013දී රු. බිලියන 1137 දක්වා වූ වර්ධනයකි. 2013දී ආදායම් බදු ඔස්සේ ලද ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය විය. එසේ සිදු වූයේ ආදායම් බදු පහළ දැමීමේ තත්වයක් තුළයි. 2013දී, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව බදු ආදායම 11.6%ක් විය. 2012දී එය තිබුණේ 12.0%ක මට්ටමේ ය. මේ අතර බදු නොවන ආදායම් දළ දේශීය නිෂ්පාදනයෙන් කලින් අවුරුද්දේ 1.9%ක සිට 1.5% දක්වා පහත වැටිණි. රජයට අයත් ව්‍යවසායන්ගේ ලාභ අඩු වීම එයට ප්‍රධාන හේතුව විය. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සමස්ත ආදායම 13.1% මට්ටමේ පැවතිණි. 2012දී එය 13.9%ක් විය.

### රජයට අයත් ව්‍යවසායන්ගේ කාර්යසාධනය - 2013

ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යසාධනයේ හා කාර්යක්ෂමතාවේ වර්ධනය සමස්ත ආර්ථික උපායමාර්ගය තුළ වැදගත් තැනක් අත්පත් කර ගත්තේ ය. රජය එම තත්වය ඇති කර ගැනීම සඳහා බලවත් පරිශ්‍රමයක් දරයි. එහි ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේදී රජයට අයත් ව්‍යවසායන්ගේ කැපී පෙනෙන ප්‍රසාරණයක් සිදු විය.

දැනට රජයට අයත් ව ඇති ව්‍යවසායන් 55හි වත්කම් පදනම 12%කින් වර්ධනය විය. එය දළ ජාතික ආදායමෙන් 59%ක් හෙවත් රු. බිලියන 5132කි. 2012දී හා 2013දී හඳුන්වා දෙන ලද ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ මෙම තත්වය ඇති කිරීමට ඉවහල් විය. ඒ අතර, පෙට්‍රෝලියම් නිෂ්පාදනවල, විදුලිය, ගමනාගමනය හා ජලය යන සේවාවන්හි මිළ ඉහළ නැංවීම තිබිණි.

ව්‍යවසායන් 55න් 43ක් ම 2013දී ලාභදායී වූ බව සඳහන් කළ යුතු ය. ඒවා ලාභ ලැබුවේ රජයේ ප්‍රතිපත්ති රාමුව තුළ ක්‍රියාත්මක වෙමින් අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා පාරිභෝගිකයන්ට දරා ගත හැකි මිළකට අලෙවි කරමිනි. බදු ගෙවීමට පෙර රු. බිලියන 44ක ලාභයක් මෙම රාජ්‍ය ව්‍යවසායන් විසින් ජනනය කරන ලදී. 2012දී සිදු වූයේ රු. බිලියන 109ක පාඩුවකි. එයට සාපේක්ෂව මෙය 162%ක වර්ධනයකි. රාජ්‍ය ව්‍යවසාය විසින් බදු නොවන රාජ්‍ය ආදායම් ලෙස රු. බිලියන 24ක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

කළමනාකරණ සංවර්ධනයන් හා ඵලදායිතා ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා යොදවනු ලබන අලුත් ප්‍රාග්ධන යෙදවුම් හේතුවෙන් මෙම ආයතන මූල්‍යමය වශයෙන් තවදුරටත් ශක්තිමත් වනු ඇති බව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය පවසයි. කාර්යක්ෂම කළමනාකරණ ක්‍රම, කුසලතා සහිත පුද්ගලයන් හා විශේෂඥයන් බඳවා ගැනීම වැනි ක්‍රියාමාර්ග ඔස්සේ අකාර්යක්ෂමතාව දුරු කර ඵලදායිතාව ඉහළ නංවා ගනිමින් වාණිජමය වශයෙන් සාර්ථකව පැවැත්ම සඳහා රාජ්‍ය ව්‍යවසායන් දිරි ගන්වනු ලැබේ. රජයේ ප්‍රතිපත්තිය පැහැදිලිව ම රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය නො කිරීමයි. එබැවින් රාජ්‍ය ව්‍යවසාය විසින් යොදනු ලබන ප්‍රාග්ධනයට සාපේක්ෂව ප්‍රතිලාභ ලබා දිය යුතු ය. රජයට අයත් ව්‍යවසායන්ගේ ගිණුම් හා විගණන ක්‍රියාවලි ශක්තිමත් කර තිබේ. ඒවා රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවේ සමීප නිරීක්ෂණයට ලක් වේ. වාර්ෂික ගිණුම් හා වාර්තා එකී කමිටුවේ නිර්නායකයන්ට අනුකූල විය යුතු ය. එසේම, රජයට අයත් ව්‍යවසායන් විසින් රජයේ මිළ දී ගැනීම් ක්‍රමවේදය අනුව කටයුතු කිරීම ද සිදු විය යුතු ය.

අනාගත ප්‍රසාරණය හා සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් තම මූල්‍ය ශක්තිය තක්සේරු කර ගැනීමට හා තමන්ගේ ම අරමුදල් සම්පාදනය කර ගැනීමට ණය අනුපාතිකයක් ලබා ගැනීමට රජයට අයත් ව්‍යවසායන් දිරිගන්වනු ලැබේ.

විවරණයට ලක් වන වසර තුළදී බැංකු, මූල්‍ය, රක්ෂණ, බලශක්ති, ජලය, වරාය, ඉදි කිරීම්, වැවිලි, පුනර්ජනනීය නොවන සම්පත්, ලොතරැයි, අලෙවි හා බෙදාහැරීම්, ජනමාධ්‍ය හා සෞඛ්‍ය අංශ ලාභ ඉපැයූ අතර ගුවන් සේවා, මගී ප්‍රවාහන, පශු සම්පත් අංශ පාඩු ලැබී ය.

2013 වසර තුළදී, රජයට අයත් ව්‍යවසායන් 37ක් විසින් බදු නොවන ආදායම් අංශයේ රජයේ ආදායම් වෙනුවෙන් රු. බිලියන 24ක දායකත්වයක් ලබා දෙන ලදී. බැංකු හා මූල්‍ය, රක්ෂණ හා ලොතරැයි යන අංශ විසින් පිළිවෙලින් රු. බිලියන 16ක්, රු. බිලියන 5ක් හා රු. බිලියන 0.5ක් වශයෙන් එයට දායක වී තිබේ.

රජයට අයත් ව්‍යවසායන්ගේ ඉහත දක්වන ලද සංවර්ධනයන් හා රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වයට දක්වන ලද දායකත්වය අතරතුරු ඒවායේ පාලනය හා කළමනාකරණය ද ජාත්‍යන්තර මට්ටමේ භාවිතාවක් ඇති වන පරිදි වැඩිදියුණු කරන ලදී. මූල්‍ය වාර්තාකරණයේ විනිවිදභාවය හා වගවීම වැඩි දියුණු කර ගනිමින් සියලු රාජ්‍ය ව්‍යවසායන් විසින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් අනුගමනය කරන ලදී. එම ප්‍රමිතීන් වේගයෙන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මට්ටමට පරිවර්තනය වෙමින් තිබේ.

## ශ්‍රී ලංකාවේ ලොතරැයි කර්මාන්තය - 2013

සංවර්ධන ලොතරැයි මණ්ඩලය හා ජාතික ලොතරැයි මණ්ඩලය යනු ලංකාවේ ලොතරැයි ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක ක්ෂණික හා සාමාන්‍ය ලොතරැයි ඉදිරිපත් කරන ආයතන දෙකයි. වෙළඳපොළ පංගුවෙන් 100%ක් ම හිමි කරගෙන තිබෙන ඒවා රජය සතු ව්‍යාපාර වෙයි. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2013 වාර්ෂික වාර්තාවට අනුව, මෙම ලොතරැයි ආයතන දෙක විසින් 2013 වසරේදී සමස්තයක් ලෙස රු. බිලියන 26.62ක ආදායමක් ලබා තිබෙන අතර ලාභය රු. බිලියන 2.45කි. ලොතරැයි කර්මාන්තය රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් 0.28% කට දායක වී තිබේ.

ජාතික ලොතරැයි මණ්ඩලය සාමාන්‍ය ලොතරැයි හතකින් හා ක්ෂණික ලොතරැයි දෙකකින් කෘෂිකර්මාන්තය, ක්‍රීඩා, සෞඛ්‍යය හා වෙනත් ව්‍යාපෘති සඳහා ඒකාබද්ධ අරමුදල ඔස්සේ දායකත්වය සපයන අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලය සාමාන්‍ය ලොතරැයි හයකින් හා ක්ෂණික ලොතරැයි තුනකින් ජනාධිපති අරමුදල ඔස්සේ සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්ට දායක වේ. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අනුව, ජාතික ලොතරැයි මණ්ඩලයේ 2013 වෙළඳපොළ පංගුව 59%කි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය 41%ක වෙළඳපොළ පංගුවකට උරුම කියයි. කර්මාන්තයේ සමස්ත ආදායම 2013දී 23%කින් ඉහළ ගියේ ය. මෙම ලොතරැයි මණ්ඩල දෙක විසින් ටිකට්පත් මිලියන 1168ක් අලෙවි කරන ලද අතර 2013දී ප්‍රකාශිත තෑගි මුදල රු. බිලියන 13.6ක් විය. එය 2012දී පැවතියේ රු. බිලියන 10.7ක් ලෙසයි. ජාතික ලොතරැයි මණ්ඩලය විසින් 2013දී ඒකාබද්ධ අරමුදලට රු. මිලියන 1756ක් ලබා දෙන ලදී. එය 12% ක වර්ධනයකි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ජනාධිපති අරමුදලට රු. මිලියන 2007ක දායකත්වයක් ලබා දෙන ලදී. එය 20%ක වර්ධනයකි.

## මූල්‍ය විවරණය

### මූල්‍ය කාර්යසාධනයේ සමස්ත ප්‍රතිඵලය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය උත්සාහ කරන්නේ සමාජමය වගකීම් ආරක්ෂා කර ගනිමින් තම ගනුදෙනුකරුවන් හා පාරිභෝගිකයන් බලාපොරොත්තු වන මට්ටමටත් වඩා ඉහළ ලෝක මට්ටමේ ලොතරැයි නිෂ්පාදන හා සේවාවන් සැපයීමටයි.

විවරණයට ලක් වන 2013 මූල්‍ය වර්ෂය සංවර්ධන ලොතරැයි මණ්ඩලයට වැදගත් මූල්‍ය වර්ෂයක් හා සංක්‍රාමීය අවධියක් විය. මෙම කාලය තුළදී මණ්ඩලය උත්සාහ කළේ ශ්‍රී ලංකාවේ ලොතරැයි ක්ෂේත්‍රයේ ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායක් ලෙස රටේ ආර්ථිකයට දායක වීම කෙරෙහි අවධානය යොමු කිරීමටයි.

2013 මූල්‍ය වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය බදු ගෙවීමෙන් පසු ජනාධිපති අරමුදලට සපයන ලද අතිරික්තය රු. මිලියන 2007.3ක් විය. ඊට කලින් අවුරුද්දේ එය රු. මිලියන 1648.4ක් විය. 2012ට සාපේක්ෂව 2013දී ජනාධිපති අරමුදලට දක්වන ලද දායකත්වය රු. මිලියන 358.9කින් වැඩි වී තිබේ. එය 21%ක වර්ධනයකි.

විවරණයට ලක් වන වසර තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉහළ ම ආදායම ලබා ගනිමින් රු. බිලියන 10.6 මට්ටම පසු කළේ ය. කලින් අවුරුද්දේ එය රු. බිලියන 8.6ක් විය 2012ට සාපේක්ෂව 2013දී වර්ධනය 23.03%කි.

2013දී ජයග්‍රාහකයන්ට ලබා දෙන ලද තෑගි මුදල රු. මිලියන 6480ක් විය. එය 2012දී ලබා දෙන ලද තෑගි මුදල වූ රු. මිලියන 5113.9ට සාපේක්ෂව 26.7%ක වර්ධනයකි. එම මුදල වනාහි සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය තුළදී තෑගි වශයෙන් ගෙවන ලද වැඩි ම මුදලයි. ඉතිහාසයේ පළමු වතාවට සංවර්ධන ලොතරැයි මණ්ඩලය ආදායම් බදු ලෙස රු. මිලියන 68.67ක් ගෙවන ලද බව ද සඳහන් කළ යුතු ය.

2013දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය සුපර් බෝල් ලොතරැයිය හඳුන්වා දුන්නේ ය. එහි ආරම්භක සුපිරි ජයමල්ල ත්‍යාගය රු. මිලියන 50කි. හයිවේ ඩ්‍රීම් ලොතරැයිය හඳුන්වා දීමත් සමග ලොතරැයි කර්මාන්තයේ විප්ලවයක් සිදු විය. එහි සුපිරි ජයමල්ල ත්‍යාගයේ වටිනාකම රු. මිලියන 100කි. මයික්‍රෝ කාර් 50ක් ද පිරිනැමේ. ඒ වනාහි ලංකාවේ

# මෙහෙයුම්

ලොතරැයි ඉතිහාසයේ ඉහළ ම ත්‍යාග ප්‍රදානයයි. රු. 100 බැගින් මිළ සලකුණු කරන ලද ලොතරැයි කීපයක් ද මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලදී. මෙම ලොතරැයිය හඳුන්වා දීම ද සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කැපී පෙනෙන ජයග්‍රහණයකි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ, සමස්ත කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව, අලෙවි නියෝජිතයන්ගේ කැපවීම හා විගණකවරුන්ගේ මග පෙන්වීම හේතුවෙන් 2013 වසර සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉහළ ඵලදායිතාවක් අත්පත් කර ගත් ඓතිහාසික වසරක් විය. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් සැලසුම් කරන ලද පරිදි සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2016 වන විට රු. බිලියන 12.04ක ආදායම් ඉලක්කයක් වෙත යා යුතු ය. නව තාක්ෂණය හා උපායශීලී අලෙවි ක්‍රම ඔස්සේ එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කැප වී කටයුතු කරයි.

### මෙහෙයුම් කාර්යසාධනයේ ප්‍රතිඵලය සංක්ෂිප්තව

විවරණයට ලක් වූ වසරේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය පෙර නොවූ විරූ ආදායම් හා ලාභ වර්ධනයක් අත්පත් කර ගත්තේ ය. 2013 / 2014 මූල්‍ය වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉතිහාසයේ වැඩිම ආදායම වන රු. බිලියන 10.6ක් ලබා ගත්තේ ය. ලාභය රු. බිලියන 2.12කි. ආදායම් වර්ධනය ඔස්සේ බදු ගෙවීමට පෙර ලාභය ශක්තිමත් ලෙස වර්ධනය වූ අතර ජනාධිපති අරමුදලට දෙන ලද දායකත්වය 21%කට වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය විය.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූලික කාර්යය වන්නේ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහනට හා අවශ්‍යතා ඇති ජනතාවට සෞඛ්‍යාධාර සැපයීම සඳහා ජනාධිපති අරමුදල වෙනුවෙන් මුදල් ඉපැයීම පිණිස ලොතරැයි නිෂ්පාදන කළමනාකරණය හා පවත්වාගෙන යාමයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාලනය වන්නේ 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ ය.

එම අරමුණ වෙනුවෙන්, විවරණයට ලක් වූ වසර තුළ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් පහත සඳහන් ලොතරැයි පවත්වාගෙන යන ලදී.

ශනිදා වාසනාව

සංවර්ධන වාසනාව

ජයෝදා

ජනජය

නියත ජය

සුපර් බෝල්

සංවත්සර වාසනා

අවුරුදු බෝනස්

හයිවේ ඩ්‍රීම්

ක්ෂණික ලොතරැයි

### මෙහෙයුම්වල කැපී පෙනෙන ලක්ෂණ

සංවර්ධන ලොතරැයි මණ්ඩලය දිවයින පුරා ක්‍රියාත්මක වන්නේ සක්‍රිය අලෙවිකරුවන් 2200ක් හා ආසන්න වශයෙන් 22,000ක් පමණ වන සිල්ලර අලෙවි සහායකයන් හරහා ය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ඍජු හා වක්‍ර රැකියා අවස්ථා 25,000ක් පමණ නිර්මාණය කර තිබේ.

### අලුත් නිෂ්පාදන දියත් කිරීම්

මණ්ඩලය සිය 30 වන සංවත්සරය සැමරූ 2013 වසර සංවර්ධන ලොතරැයි මණ්ඩලයට කැපී පෙනෙන වසරක් විය. මෙම වසර තුළදී අලුත් නිෂ්පාදන කීපයක් දියත් කරන ලද අතර පැරණි නිෂ්පාදන ද අලුත් ලක්ෂණ සහිතව නැවත නිකුත් කරන ලදී.

### සංවත්සර වාසනා

වසර ආරම්භ කරනු ලැබුවේ සංවර්ධන ලොතරැයි මණ්ඩලය 30වන වසර සැමරූ 2013 වසරේ ජනවාරි 19දා දිනුම් ඇදීමට නියමිත වූ 'සංවත්සර වාසනාව' සමගයි. ලොතරැයිය රු. 100කට මිළ කරන ලද අතර අංක තුනක්, බෝනස් අංකයක් හා ඉංග්‍රීසි අකුරක් ගැලපිය යුතු විය. සංවත්සර වාසනා විසින් පිරිනමන ලද සුපිරි ජයමල්ල මුදල රු. මිලියන 10කි.

### අවුරුදු බෝනස්

සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද සමරනු වස් රු. 100ක් මිළ සලකුණු කරන ලද ලොතරැයි පතක් 2013 මාර්තු 19දා නිකුත් කරන ලදී. එය දිනුම් අදිනු ලැබුවේ 2013 අප්‍රේල් 10දා ය. අංක තුනක්, බෝනස් අංකයක් හා ඉංග්‍රීසි අකුරක් ගැලපිය යුතු විය. සුපිරි ජයමල්ල ත්‍යාගය ලෙස සුඛෝපභෝගී මෝටර් රියක් පිරිනමන ලදී.

### සුපර් බෝල්

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රධානම ලොතරැයියක් වන 'සුපර් බෝල්' ලොතරැයියට වසරක් සපිරීම වෙනුවෙන් 2013 ජූලි 23දා උත්සව පැවැත්විණි. ඒ සමග ම 'සුපර් බෝල්' ලොතරැයියේ දිනුම් නො ලද ටිකට් පත්වලට 'සුපර් බෝල් රන් කාසි වරම්' පිරිනමන අලුත් දිනුම් ඇදීමක් හඳුන්වා දෙන ලදී. විශේෂ දිනුම් ඇදීමකින් ජයග්‍රාහකයන්ට රන් කාසි 10ක් ලබා දෙන ලදී. මෙහි ප්‍රවර්ධනය 2013 නොවැම්බර් 14දා සිදු කරන ලදී.

සඳුදා හා බ්‍රහස්පතින්දා දිනුම් අදින ලද 'සුපර් බෝල්' ලොතරැයිය සෙනසුරාදාට ද නිල් වර්ණයෙන් හඳුන්වා දෙන ලදී. පළමු සෙනසුරාදා දිනුම් ඇදීම 2013 නොවැම්බර් 9දා සිදු විය.

### හයිවේ ඩ්‍රීම්

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු. 100ක මිළක් සලකුණු කරමින් වෙළඳපොළේ ඉහළ තීරය ඉලක්ක කර ගත් 'හයිවේ ඩ්‍රීම්' ලොතරැයිය 2013 ඔක්තෝබර් 27දා දියත් කරන ලදී. එය සිදු වූයේ ශ්‍රී ලංකාවේ දෙවන අධිවේගී මාර්ගය කොළඹ සිට කටුනායක දක්වා විවෘත වීමට සමාන්තරවයි. පළමු ලොතරැයිය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට පිරිනමනු ලැබුවේ ජාඇලදී පැවැත්වුණු උත්සවයකදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ විසිනි. අංක තුනක් හා සුපිරි වාසනා අංකයක් ගැලපීමෙන් ජයග්‍රාහකයාට ඉතිහාසයේ වැඩි ම තෑගි මුදල වූ රු. මිලියන 100ක් දිනා ගත හැකි වූ අතර අංක තුනක් පමණක් ගැලපීමෙන් අලුත්ම මයික්‍රෝ මෝටර් රියක් දිනා ගත හැකි විය.

### සුපිරි ශනිදා - ශනිදා වාසනාව ලොතරැයිය ප්‍රවර්ධනය කිරීම, 2013 පෙබරවාරි

මෙම ප්‍රවර්ධනයේ විශේෂත්වය වූයේ සාමාන්‍ය ශනිදා වාසනාව ලොතරැයියට අමතරව විශේෂ 'සුපිරි ශනිදා වාසනා' ලොතරැයියක් දිනුම් ඇදීමයි. 'සුපිරි ශනිදා' අංක ද එම ටිකට් පතේ ම මුද්‍රණය කරන ලද අතර, දෙවන දිනුම් ඇදීමේ ජයග්‍රාහකයන්ට රු. ලක්ෂය බැගින් වූ තෑගි පෙළක් ම පිරිනමන ලදී. ජයග්‍රාහකයන්ට අංක 1 සිට 30 දක්වා ගැලපිය යුතු වූ අතර ජයග්‍රාහකයෝ 99දෙනෙක් රු. ලක්ෂය බැගින් තෑගි දිනා ගත් හ. ඒ සාමාන්‍ය ශනිදා වාසනා දිනුම් ඇදීමට අමතරවයි. මෙම දිනුම් ඇදීම පවත්වනු ලැබුවේ 2013 පෙබරවාරි 20දා ය.

### වැඩිපුර තෑගි සමග ජනජය නැවත නිකුත් කිරීම

ජනජය ලොතරැයිය ද අලුත් තෑගි මාලාවක් ම සමග නැවත නිකුත් කරන ලදී. සුපිරි අංකය වෙනුවට ඉංග්‍රීසි අකුරක් හඳුන්වා දෙන ලදී. පළමු දිනුම් ඇදීම පැවැත්වුණේ 2013 ඔක්තෝබර් 23දා, බදාදා ය. අංක හතරක් හා ඉංග්‍රීසි අකුරක් ගැලපීමෙන් ජයග්‍රාහකයාට රු. මිලියන 50ක සුපිරි ජයමල්ල තෑගි මුදලක් පිරිනමන ලදී.

### ජයෝදා ලොතරැයිය වෙනුවෙන් පවර් බෝල් ප්‍රවර්ධනය

මුල් පෙළේ ලොතරැයියක් ලෙස වෙළඳපොළේ ජනප්‍රිය වී තිබෙන 'ජයෝදා' විශේෂ දිනුම් ඇදීමක් 2013 නොවැම්බර් 4දා පැවැත්විණි. සාමාන්‍ය 'ජයෝදා' ලොතරැයි ටිකට් පතේ සාමාන්‍ය දිනුම් අංක හතර හා ඉංග්‍රීසි අක්ෂරයට අමතරව තවත් දිනුම් අංක හතරක් පවර් බෝල් වෙනුවෙන් ඉදිරිපත් කරන ලදී. පවර් බෝල් විශේෂ දිනුම් ඇදීමෙහිදී අංක හතරක් ගලපා රු. ලක්ෂයක තෑගි දිනා ගත හැකි විය. මෙම දිනුම් ඇදීම ඔස්සේ සාමාන්‍ය 'ජයෝදා' තෑගිවලට අමතරව රු. ලක්ෂය බැගින් අමතර තෑගි 100ක් ජයග්‍රාහකයන්ට ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමත් විය.

### දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය - 2013 මාර්තු 23 සිට 30 දක්වා

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2013 මාර්තු 23 සිට 30 දක්වා අම්පාරේදී පවත්වන ලද 'දැයට කිරුළ ප්‍රදර්ශනයේ' ප්‍රධාන මූල්‍ය අනුග්‍රාහකයා විය. රජයේ සංවර්ධන සැලසුම් වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ දායකත්වය සලකුණු කරමින් රු. මිලියන 100ක අනුග්‍රාහකත්වයක් සපයන ලදී. නරඹන්නන්ට ටිකට් පත් අලෙවි කිරීමේ වගකීම භාර ගත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය එම ටිකට් පත් වෙනුවෙන් විශේෂ දිනුම් ඇදීමක් පවත්වමින් රු. මිලියන 66ක වටිනාකමින් යුත් ත්‍රිරෝද රථ අටක්, මෝටර් සයිකල් අටක්, ස්කූටර් අටක්, බයිසිකල් 40ක් හා පෝසිලේන් කට්ටල 80ක් තෑගි ලෙස පිරිනමන ලදී.

ටිකට් කවුන්ටර සඳහා අවශ්‍ය පිරිස් බලය සපයමින් දැයට කිරුළ ප්‍රදර්ශනයේදී යුද හමුදාව විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට පිරිනමන ලද සේවා වෙනුවෙන් මණ්ඩලය විසින් යුද හමුදා සුබසාධක සංගමයට රු. මිලියන 3.3ක ප්‍රදානයක් කරන ලදී. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ මහතා විසින් මේ හා අදාළ චෙක්පත යුද හමුදාවේ නැගෙනහිර ආඥාපති මේජර් ජනරාල් ලාල් පෙරේරා වෙත පිරිනමන ලදී.

මෙහෙයුම් පද්ධති හා ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට ද මෙම කාලය තුළ පියවර ගන්නා ලදී.

### පද්ධති විශ්ලේෂණය හා විවරණය

KPMG වෙතින් ලබා ගත් උපදේශන සහයෝගය සමග සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය පද්ධති හා ක්‍රියාවලි විවරණය කිරීම ඇරඹූ අතර එහි අභිමතාර්ථය වූයේ පූර්ණ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් සහිත රාජ්‍ය ව්‍යාපාරික සංවිධානයක් බවට පත් වීමේ අනාගත අරමුණින් මණ්ඩලයේ කාර්යක්ෂමතාව තවදුරටත් ඉහළ නැංවීමයි. කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අදාළ ක්ෂේත්‍රවල පුහුණු හා සංවර්ධ වැඩසටහන් පවත්වන ලදී.

### ISO 9001- 2008 සහතිකකරණය

විවරණයට අදාළ වන වර්ෂය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය ISO 9001- 2008 සහතිකය සඳහා ඉල්ලුම් කළේ ය. එයින් අපේක්ෂා කළේ පාරිභෝගිකයන් විෂයෙහි වඩාත් ගුණාත්මක සේවා සැපයීම කෙරෙහි නම්නීකරණය වූ සංවිධානයක් බවට පත් වීමයි.

# මෙහෙයුම්

### තොරතුරු තාක්ෂණය යටිතල පහසුකම් හා පද්ධති නවීකරණය

2013 වසරේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අලුත් වෙබ් ලිපිනයක් ද, ප්‍රධාන කාර්ය මණ්ඩල නිලධාරීන් වෙනුවෙන් විද්‍යුත් තැපැල් ලිපින ද හඳුන්වා දෙන ලදී. එසේම වාහන ඉල්ලා සිටීමේ විද්‍යුත් ක්‍රමය හා ජීපීඑස් මගින් වාහන පිහිටි ස්ථාන සොයා ගැනීමේ ක්‍රමය ද දියත් කරන ලදී. අලුත් වයිරස් ආරක්ෂණ ක්‍රම හා ෆයර්වෝල් භාවිතයෙන් තොරතුරු තාක්ෂණ පද්ධතියේ ආරක්ෂාව ද ඉහළ නංවන ලදී.

### යටිතල පහසුකම් සංවර්ධනය

මූලස්ථානයේ ප්‍රධාන කාර්යාලය දෙවන ගොඩනැගිල්ලට යා කරන පාලම මෙම කාලය තුළදී ඉදි කරන ලදී. දෙවන ගොඩනැගිල්ලේ විදුලි සෝපාන සවි කිරීම ද ආරම්භ කරන ලදී.

### අලෙවිකරුවන් දිරිගැන්වීම

මෙම දිරිගැන්වීම අලෙවිකරුවන් හා බෙදාහරින්නන් අතර අතිශය ජනප්‍රිය විය. සාමූහික දිරි දීමනාවක් වූ එහිදී බෙදාහරින්නා හා අලෙවිකරුවා කණ්ඩායමක් ලෙස කටයුතු කළ යුතු විය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඔවුන්ට අලෙවි ඉලක්කයක් ලබා දෙන ලදී. දිරි දීමනාව ලබා ගැනීම සඳහා එම ඉලක්කය පසු කළ යුතු ය. මෙම වසරේදී බොහෝ බෙදාහරින්නෝ හා අලෙවිකරුවෝ සාර්ථක ලෙස ඉලක්ක සපුරමින් දිරි දීමනා දිනා ගත්හ.

# තිරසර වාර්තාව

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පසුගිය දශක තුන පුරා ම ස්ථායී ව්‍යාපාරයක් විය. සමීප හවුල්කරුවන්ගේ අවශ්‍යතාවන්ට පමණක් සීමා නො වෙමින්, සමස්ත සමාජයේ ම දීර්ඝ කාලීන අවශ්‍යතා හා වටිනාකම් සමග ගැටුම් ඇති නො වන පරිදි තරගකාරී ව්‍යපාර මූලෝපායන් සැකසිය යුතු බව සමාරම්භයේ සිට ම සංවර්ධන ලොතරැයි මණ්ඩලය විශ්වාස කළේ ය. සමාගමේ ස්ථායීභාවය පිළිබඳ වාර්තාව සමන්විත වන්නේ එහි සමාගම් විස්තර, ස්ථායීකරණ උපායමාර්ගය, ආර්ථික වගකීම, සමාජ වගකීම හා පාරිසරික වගකීම යන කොටස්වලිනි.

කාලයත් සමග තම ලොතරැයි නිෂ්පාදන හා තෑගි ඔස්සේ ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිතවල ස්ථාවර හා කල් පවත්නා වටිනාකම් නිර්මාණය කරන වර්ධනයක් වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය කැප වී සිටියි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සමාජ, පාරිසරික හා ආර්ථික වගකීම සම්බන්ධයෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කර ඇති ආකාරය මෙම වාර්තාවේ හුවා දක්වනු ලැබේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමාජ වගකීම තුළට වගකීම් සහගත ව්‍යාපාරකරණය හා පාරිභෝගිකයාගේත්, ලොතරැයි ජයග්‍රාහකයාගේත් ආරක්ෂාව සම්බන්ධ මුලපිරුම් ද, ප්‍රජාව වෙත සේවා සැපයීමේ වැඩසටහන් ද ඇතුළත් වේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම් ද අධීක්ෂණය කරයි. බලශක්ති සංරක්ෂණය සඳහා ආයෝජනයන් සිදු කරන්නේ පාරිසරික වගකීම නිසා ය. විනිවිද පෙනෙන හා සමබර පාලන මාදිලිය විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආර්ථික වගකීම නිරූපණය වේ.

2013දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 100ක මිළකින් යුත් ටිකට් පතක් හඳුන්වා දීම, රුපියල් මිලියන 50ක සුපිරි ජයමල්ල ත්‍යාගයක් පිරිනැමෙන 'සුපර් බෝල්' ලොතරැයිය හඳුන්වා දීම, ලොතරැයි ඉතිහාසයේ ඉහළ ම සුපිරි ජයමල්ල ත්‍යාගය පිරිනමන ලද 'හයිවේ ඩ්‍රීම්' ලොතරැයිය දියත් කිරීම හා එය තැපැල් දෙපාර්තමේන්තුවේ සහායෙන් දිවයින පුරා තැපැල් කාර්යාල හරහා අලෙවි කිරීම, රාජ්‍ය ජංගම දුරකථන සේවා සපයන්නකු වන මොබිටෙල් සමග එක්වී ලොතරැයිය දියත් කිරීම වැනි විවිධ ක්‍රම ඔස්සේ ලොතරැයි ව්‍යුහය නවීකරණය කළේ ය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නවීකරණ වැඩසටහන ඔස්සේ පාරිභෝගික අත්දැකීම සංවර්ධනය කිරීම, රැකියා නිර්මාණය කිරීම, ජනාධිපති අරමුදලට හා මහපොළ ශිෂ්‍යත්ව භාරකාර අරමුදලට කරන දායකත්වයන් ඔස්සේ සෞඛ්‍යාරක්ෂාව හා අධ්‍යාපනය සඳහා දායක වීම වැනි දේ ද සිදු විණි. නවීකරණය විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය වැඩිදුරටත් පාරිභෝගික සේවා වෙත යොමු වූ සංවිධානයක් බවට පත් කිරීමට ඉලක්ක කරන ලදී.

### සමාගම් විස්තරය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය රජයට අයත් ව්‍යවසායක් වන අතර 1983 ජනවාරි 19දා එය පිහිටුවනු ලැබුවේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාවගේ ජීවිත සරුසාර කිරීමේ අරමුණින් නව නිර්මාණාත්මක ලොතරැයි උපායමාර්ගයක් දියත් කිරීම සඳහා ය.

දෙවන විශාලතම ලොතරැයි සමාගම වන සංවර්ධන ලොතරැයි මණ්ඩලය මේ වන විට සේවකයන් 231 දෙනෙකුගෙන්, දිවයින පුරා සක්‍රිය අලෙවිකරුවන් 2200කින් හා ආසන්න වශයෙන් 22,000ක් වන අලෙවි සහායකයන් පිරිසකගෙන් සමන්විත වේ. මෙම වසර තුළදී සමාගම සිය ලොතරැයි නිෂ්පාදන සංඛ්‍යාව 10ක් දක්වා වර්ධනය කළ අතර ජනාධිපති අරමුදලේ හා මහපොළ භාරකාර අරමුදලේ ප්‍රධාන දායකයා බවට පත් විය. එමගින් එය ශ්‍රී ලංකාවේ සුවිසල් ප්‍රජාවකට උපකාර විය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමාගම් දූත මෙහෙවර ඔස්සේ පාරිභෝගිකයන් හා හවුල්කරුවන් සමග සුහදව කටයුතු කිරීමට සේවකයන් යොමු කරනු ලැබේ. අප කරන සෑම දෙයක් ඔස්සේ ම අපගේ අරමුණ නිරූපණය කිරීමට ද, අපගේ දැක්ම අවබෝධ කර ගැනීමට ද, පැහැදිලිව හඳුනාගත් වටිනාකම් ඇතුළත් කර ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

### අපගේ අරමුණ හා වටිනාකම්

අපගේ එකම අරමුණ වන්නේ ශ්‍රී ලංකාව පුරා ජීවත් වන ජනතාවගේ ජීවිත වඩා යහපත් කිරීමයි. එසේ කරනු ලබන්නේ ප්‍රාදේශීය වශයෙන් ආදායම් ජනනය කිරීමෙන් හා ආර්ථික හා සමාජ ප්‍රතිලාභ ජනතාවට ලබා දීමෙනි. විස්මය ඇති කරමින් සිහින සැබෑ කර ගැනීමට උපකාර කරන අපි වගකීම් සහගත ලෙස ලොතරැයි දියත් කිරීම ඔස්සේ විශ්වාසය දිනා ගැනීමට කැප වන්නෙමු. අප ලබන ලාභයෙන් හා අප විසින් නිර්මාණය කර තිබෙන රැකියා අවස්ථා විසින් අපගේ සාර්ථකත්වය නිරූපණය වේ. අපගේ ශක්තිය වන්නේ අපගේ පාරිභෝගිකයන්ගේ සංකීර්ණත්වය අවබෝධ කර ගැනීමයි. වගකීම් සහගත වන ගමන් ම අපි ඉහළ ප්‍රමිතියකින් යුක්තව අපගේ කටයුතු සිදු කිරීමේ හා පාරිභෝගික සේවා සැපයීමේත්, පොදු අවශ්‍යතාවන් සම්බන්ධව කටයුතු කිරීමේත් වගකීම භාර ගනිමු.

නිසි දේ නිසි අන්දමින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් අපි එක්ව ක්‍රියාත්මක වෙමු. අපි අපගේ පාරිභෝගිකයන් හා ව්‍යාපාරික හවුල්කරුවන් අපගෙන් බලාපොරොත්තු වන දේ හා ශ්‍රී ලාංකික ජනතාව අපගෙන් අපේක්ෂා කරන දේ අතර තුලනයක් නිර්මාණය කරන්නෙමු. අපගේ පාරිභෝගිකයන්ට, සේවකයන්ට, හවුල්කරුවන්ට හා ජනතාවට අපගේ ගෞරවය හිමි වේ. එම ගෞරවය ආරම්භ වන්නේ අප වටා සිටින විවිධාකාර වන ජනතාවන්ගේ අදහස්වලට අවංකව හා විවෘතව සවන් දීමෙනි.

### මානව සම්පත්

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයෝ සමායතන වටිනාකම් නියෝජනය කරන තානාපතිවරු වෙති. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්‍රියාකාරකම්වලට සහයෝගය දීමෙන්

# තිරසර වාර්තාව

ජාතික වගකීමට උර දෙනවාට අමතරව අපගේ සේවකයෝ විවිධ ප්‍රජා මුලපිරුම්වල ද යෙදෙති. ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කර දීමට දායක වීම, සුබසාධන සේවාවන්ට උපකාර කිරීම හා පාරිසරික ව්‍යාපෘති වැනි කොයි කාර්යයේදීත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයෝ ශ්‍රී ලංකාව වඩා යහපත් රටක් බවට පත් කිරීම වෙනුවෙන් කැප වී කටයුතු කරති.

අපගේ මානව සම්පත් භාවිතයෙහිදී අපි සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයන්ගේ ධාරිතාවන් සමාගමේ අරමුණු සමග සමපාත වන සේ කටයුතු කරන්නෙමු. ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය සිදු වන පරිදි පුහුණුවීම් සිදු කෙරේ. විවරණයට ලක් වන වසර තුළදී පහත සඳහන් වැඩසටහන් පවත්වන ලද අතර සේවක මණ්ඩලයේ ධාරිතා හා සම්පත් සංවර්ධනය කිරීම පිණිස තවත් වැඩසටහන් කීපයකට මුල පුරන ලදී.

- කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ ක්ෂේත්‍රවල පුහුණු හා සංවර්ධන වැඩසටහන් 312ක් පවත්වන ලදී.
- රු. මිලියන 30.9ක වියදමින් මූලස්ථාන ගොඩනැගිල්ල හා දෙවන ගොඩනැගිල්ල යා කරන පාලම ඉදි කරන ලදී. දෙවන ගොඩනැගිල්ලේ විදුලි සෝපාන සවි කරන ලදී.
- ප්‍රවාහන මෙහෙයුම් හා අදාළව වාහන තිබෙන ස්ථාන හඳුනා ගැනීමේ ජී.පී.එස් තාක්ෂණය ක්‍රියාත්මක කරන ලද අතර වාහන ඉල්ලුම් ක්‍රමය විධිමත් කරන ලදී.
- සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙනුවෙන් නව වෙබ් ලිපිනයක් හා කාර්ය මණ්ඩලයේ ප්‍රධාන සාමාජිකයන් වෙනුවෙන් නව විද්‍යුත් තැපැල් ලිපින නිර්මානය කරන ලදී.
- විවරණයට ලක් කරනු ලබන වසර තුළදී ISO 9001-2008 ප්‍රමිති සහතිකකරණය සඳහා අයදුම් කරන ලදී. එහි අරමුණ වන්නේ වඩාත් ගුණාත්මක සේවාවක් පාරිභෝගිකයන්ට සැපයීමයි.
- රු. මිලියන 35ක වියදමින් පූර්ණ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කැඳවන ලදී.
- වාර්ෂික කාර්ය මණ්ඩල චාරිකාව මීගමුවේ ගෝල්ඩ් සෑන්ඩ් හෝටලයේදී පවත්වන ලදී.
- කාර්ය මණ්ඩලය වෙනුවෙන් වාර්ෂිකව පවත්වනු ලබන සිංහල අවුරුදු උත්සවය පවත්වන ලදී.
- කාර්ය මණ්ඩලයේ සහායෙන් ජනතාව වෙනුවෙන් මඤ්ඤොක්කා දන්සැලක් පවත්වන ලදී.
- කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ජීවන තත්වය නැංවීම උදෙසා කාලීන වැදගත්කමක් ඇති විවිධ විෂයන් ඔස්සේ මාසික සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී.

2013 වසර තුළ බඳවා ගැනීම් හා ඉවත් වීම් සිදු වූ ආකාරය පහත වගුවෙන් නිරූපණය වේ.

### කාර්ය මණ්ඩල බඳවා ගැනීම්

| තනතුර | තනතුරේ ස්වභාවය | කාර්ය මණ්ඩල තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) | කොන්ත්‍රාත් | 1 |
| පර්යේෂණ සහකාර | කොන්ත්‍රාත් | 1 |
| කළමනාකරණ සහකාර | කොන්ත්‍රාත් | 4 |
| රියදුරු | කොන්ත්‍රාත් | 1 |
| උපදේශක | කොන්ත්‍රාත් | 2 |

### කාර්ය මණ්ඩල ඉවත් වීම්

| තනතුර | තනතුරේ ස්වභාවය | කාර්ය මණ්ඩල තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| රියදුරු | ස්ථිර | 1 |
| රියදුරු | කොන්ත්‍රාත් | 1 |

2013 වසර තුළ රු. මිලියන 1.48ක වියදමක් දරමින් බඳවා ගන්නා ලද සේවකයන් පහත සඳහන් පුහුණුවීම් වැඩසටහන්වලට සහභාගි කරවන ලදී. ඒ ඔස්සේ ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම හා අපගේ ප්‍රජා සංවර්ධන වැඩසටහන් ඔස්සේ දරිද්‍රතාව දුරලීම ඉලක්ක කරන ලදී.

කෙටි යෙදුම්:

KKS – කාර්යාල කාර්ය සහායක

MA – කළමණාකාර සහකාර

DR - රියදුරු

| වැඩසටහන | සහභාගි කර ගන්නා ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | මාසය |
|---|---|---|
| KKS සඳහා කුසලතා සංවර්ධනය | 11 | ජනවාරි |
| MA සඳහා කුසලතා සංවර්ධනය | 16 | ජනවාරි |
| MA සඳහා කුසලතා සංවර්ධනය | 11 | පෙබරවාරි |
| MA සඳහා ලේකම් පුහුණුව | 1 | පෙබරවාරි |
| MA සඳහා ගබඩා හා මිළ දී ගැනීම් | 2 | පෙබරවාරි |
| KKS සඳහා කුසලතා සංවර්ධනය | 11 | පෙබරවාරි |
| MA ගෘහස්ථ පුහුණුව | 35 | අප්‍රේල් |
| MA ගෘහස්ථ පුහුණුව | 32 | මැයි |
| ඉදිරිපත් කිරීම් කුසලතා | 2 | මැයි |
| මානව සම්පත් ඩිප්ලෝමා | 1 | ජූනි |
| DR ගෘහස්ථ පුහුණුව | 16 | ජූනි |
| සුපරීක්ෂක සංවර්ධනය | 8 | ජූනි |
| KKS ගෘහස්ථ පුහුණුව | 22 | ජූනි |
| ප්‍රවාහන කළමනාකරණය | 1 | ජූනි |
| මූල්‍ය පනත | 2 | ජූලි |
| KKS ගෘහස්ථ පුහුණුව | 22 | ජූලි |
| නායකත්වය හා පෞරුෂය | 7 | ජූලි |
| කාල කළමනාකරණ කුසලතා | 3 | ජූලි |
| රියදුරු ප්‍රායෝගික | 16 | ජූලි |
| අයවැය හා පිරිවැය පාලනය | 1 | ජූලි |
| පෞද්ගලික ලිපිගොනු නඩත්තුව | 2 | අගෝස්තු |
| KKS සඳහා කුසලතා සංවර්ධනය | 8 | අගෝස්තු |
| මානව සම්පත් ඩිප්ලෝමා | 1 | අගෝස්තු |
| වැටුප් පරිවර්තනය | 1 | අගෝස්තු |
| ආරක්ෂක ගෘහස්ථ 1 කොටස | 10 | සැප්තැම්බර් |
| MA පළමු පංතිය ගෘහස්ථ පුහුණුව | 8 | ඔක්තෝබර් |
| GDS ප්‍රේමතිලක - ඩිප්ලෝමා | 1 | ඔක්තෝබර් |
| WGD රුද්‍රිගු - විදුලි පාඨමාලාව | 1 | ඔක්තෝබර් |
| බෙදාහැරීම් පුහුණුව දේශනය | 60 | නොවැම්බර් |
| බෙදාහැරීම් පුහුණුව | 60 | නොවැම්බර් |

### ස්ථායීභාවය හා සමායතන සමාජ වගකීම උපාය මාර්ගය

